73

RG/ශජ/1/වකුලේඛ

IRD/SD/DMB/Land Tax/Information/2017 - 04

2017.04. 11

කොමසාරිස් (මුද්දර බදු),

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,

කොළඹ 02.

**<u>2013 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - දේපල පැවරීම මත 100% බද්ද ප්‍රතිශෝධනය කිරීම සහ විදේශිකයන්ට දේපල අයිතිය පැවරීම තහනම් කිරීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2017.04.11 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එකී ලිපියේ සඳහන්ව ඇති දිනවලදී නිකුත් කරන ලද ලිපිවලට අනුකූලව එකී කාරණය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මහජන නොතාරිස්වරුන් දැනුම්වත් කිරීමට පුවත්පත් දැන්වීම් හෝ චක්‍රලේඛයක් නිකුත් කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

03. එහෙත් එකී ලිපිවල සඳහන් උපදෙස් වලට අනුකූලව කටයුතු කරන මෙන් මෙම දෙපාර්තමේන්තුවේ සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර්වරුන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීම සඳහා චක්‍රලේඛ නිකුත් කර ඇති බවද කාරුණිකව දන්වා සිටිමි.

රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට.

ජේ. සෝ. සී. එස්. ජාගොඩ ආරච්චි
සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්